මගේ අංකය: ED/02/15/2023/OT

පාලන අංශය,

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,

අංක 353, කෝට්ටේ පාර,

රාජගිරිය.

2022.11. 09

සියලුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්,

සියලුම සුරාබදු අධිකාරීවරුන්,

සියලුම සුරාබදු ස්ථානාධිපතිවරුන් හා

සුරාබදු ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන් වෙත.

## අතිකාල දීමනා අනුමැතිය ලබා ගැනීම

මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒකාබද්ධ සේවා නිලධාරීන්ගේ පැය 40 ඉක්මවූ අතිකාල සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමේදී කාර්තුවට අදාළ සියලු අයදුම්පත්‍ර ඒකරාශී කොට එක් ලිපියක් මගින් පමණක් අදාළ නිර්දේශය මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු බවට තීරණය වී ඇති බැවින් 2023 ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන පළමු කාර්තුවට අදාළව ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ අතිකාල ඉල්ලීම් ඇතොත් ඒවා **2022.11.25 දිනට පෙර** පාලන ශාඛාව වෙත ලැබෙන්නට සලස්වන මෙන් කරුණිකව දන්වා සිටිමි.

02. **එසේම ඒ ඒ කාර්තුව ආරම්භවීමට මාසයකට පෙර අදාළ අතිකාල අයදුම්පත්‍ර ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන්නට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටින අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍රවලට අදාළව අනුමැතිය ලබා දීමට හැකියාවක් නොමැති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.**

රෝහණ සේනාරත්න

සුරාබදු කොමසාරිස් (පාලන / මානව සම්පත්)

සුරාබදු කොමසාරිස් ජනරාල් වෙනුවට

රෝහණ සේනාරත්න
සුරාබදු කොමසාරිස් (පාලන / මානව සම්පත්)
සුරාබදු කොමසාරිස් ජනරාල් වෙනුවට